**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 01 - 2019**

-----------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 01 හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ණය ගිවිසුම් අංක 3267 – (එස්ආර්අයි) හි 4.06(අ) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2015 සැප්තැම්බර් 17 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3268 – (එස්එෆ්) හි 04.03(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

-----------------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයෙහි කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීමේ වැඩසටහනෙහි අරමුණු වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 28,713 කට සමාන එ.ජ.ඩො. මිලියන 190 ක් වූ අතර, ඉන් රු.මිලියන 22,668 කට සමාන එ.ජ.ඩො. 150 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රු. මිලියන 6,045 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යයනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2015 සැප්තැම්බර් 17 වන දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට එය අවසන් කිරීමට නියමිතව ඇත. කෙසේ වුවද වැඩසටහනේ කාර්යය නිමකළ යුතු කාලය 2022 ජුනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

වැඩසටහනෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

-----------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

## 2.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ප්‍රධාන සංරචකයන් 3 ක් යටතේ වැඩසටහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කල අතර කාර්යයන් වල භෞතික ප්‍රගතිය පහත විග්‍රහකර දැක්වේ.

| සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට<br>බලාපොරොත්තු වන ප්‍රගතියේ ප්‍රතිශතය | 2019 දෙසැම්බර් 31 දිනට<br>ලගාකරගත් ප්‍රගතියේ ප්‍රතිශතය | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| ඉහල ඇලහැර ඇල ඉදිකිරීම | 60 | 38 | කොන්ත්‍රාත්කරු විසින් තාවකාලිකව වැඩ නතර කිරීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රමාද වී ප්‍රදානය කිරීම සිදුකර තිබුණි. | වැඩ නිමකිරීමේ ප්‍රමාදය නිසා පිරිවැය වැඩි කිරීමට සිදුවිය හැකිය. | කොන්ත්‍රාත්තුව යටතේ පවතින ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන් සහිතව ආරම්භ කිරීම. |
| වයඹ පළාත් ඇල ඉදිකිරීම | 65 | 30 | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීම සහ ප්‍රදානය කරන ලද අනෙකුත් කොන්ත්‍රාත් 2 යටතේ ක්‍රියාත්මක වීම් වල ප්‍රගතිය මන්දගාමී විය. | පාර්ශව කරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමට නොහැකිවිය හැකිය. | වැඩ සැලසුමේ පැවති අඩු පාඩු හා ඉඩම් අත්කර ගැනීමේ ගැටළු හේතුවී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| මිනිපේ වම් ඉවුර ඇල පුනරුත්ථාපනය | 74 | 48 | කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මන්දගාමී විය. | පාර්ශව කරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමට නොහැකිවිය හැකිය. | සිවිල් ඉදිකිරීම් කටයුතුවල හා සැලසුම්වල පැවති අඩුපාඩු හේතු වී තිබුණි. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** - ඉහළ ඇලහැර ඇල, වයඹ පලාත් ඇල සහ මිනිපේ වම් ඉවුරු ඇල ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය 2020 මැයි 31 දිනට පිළිවෙලින් සියයට 40 ක්, සියයට 32 ක්, සියයට 62 ක් ළඟාකරගෙන තිබුණි.

**විගණකගේ නිර්දේශය** - ව්‍යාපෘතිය මගින් නියමකර ඇති කාලසීමාව තුල සඵලදායි ලෙස වැඩ නිම කිරීමට හැකිවන පරිදි සමීපව අධ්‍යනය කිරීම අවශ්‍යයි.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| ---------- | ------ | --------------------- | ------------- |
| (අ) මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ කාල සටහනට කුඩාවැව් පුනුරුත්ථාපනය කිරීම් ඇතුලත් කර නොතිබුණද, වයඹ පලාත් ඇල ව්‍යාපෘතිය යටතේ කුඩා වැව් 50 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු. මිලියන 200 ක් වෙන්කර තිබුණි. කෙසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.3.2 අනුව කුඩා වැව් පුනරුත්ථාපනය කිරීම සඳහා වන සමස්ත ඇස්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණි. තවද, මේ දක්වා අනුමත කර නොතිබුණු ණය අදියර 3 හි ICB – 04 කොන්ත්‍රාත් පැකේජය නිම කිරීමෙන් පසු එම වැව් අයත් එල්ලංගා පද්ධතියට ජල හැරවුමක් යොදාගෙන ජලය ලබා දිය හැකිය. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවා යාම | සටහනට යටත්ව එකඟ වෙමි. කෙසේවෙතත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන 2,310 ක අයවැය ප්‍රතිපාදන අපේක්ෂා කළ අතර අයවැය සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන නොලැබුණි. එබැවින් කුඩා වැව් 50 ක් පුනුරුත්ථාපනය කිරීම සඳහා මහවැලි අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 200 ක් වෙන්කරන ලදි. කෙසේවෙතත්, මූල්‍යමය බාධාවන් හේතුවෙන් නියමු ව්‍යාපෘතියක් ලෙස එක් වැවක් පමණක් පුනරුත්ථාපනය කරන ලදි. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩ සටහනෙහි ණය අදියර 03 හි ගිවිසුම අත්සන් කරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. | අමතර වැඩ හා පිරිවැය අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (9b)<br>(ආ) මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1 යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ 9 න්, කොන්ත්‍රාත් පැකේජ 6 කම කොන්ත්‍රාත් කාලය අවසන් වන විට වැඩනිම කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඉක්මවා යාම. | සටහනට යටත්ව එකඟ වෙමි. කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දීර්ඝ වීම, ආසියානු සංවර්ධන බැංකුවෙන් නිශ්කාශනය ලබාගැනීමට ප්‍රමාද වීම, | ඉලක්ක සපුරාගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි ක්‍රියාකාරකම්වලින් පරිපූර්ණ විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉතිරි කොන්ත්‍රාත් පැකේජ 3 අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගෙන නොතිබුණි. තවද, 2017 වර්ෂයේදි ප්‍රදානය කිරීමට නියමිතව තිබූ NWPCP – ICB – 1 කොන්ත්‍රාත් පැකේජය 2019 දෙසැම්බර් 31 වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | | කොන්ත්‍රාත්කරුවන්ගේ ද්‍රවශීලතා ගැටලු, කොන්ත්‍රාත්තුව අත්හිටුවීම හා නිරන්තර ජල ගැටලු හා ගංවතුර හේතුවෙන් වැඩනිම කර නොතිබුණි. NWPCP – ICB – 1 කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගත් ලංසුකරු වන CML පුද්ගලික සමාගම කොන්ත්‍රාත්තුව නිම කරන අවස්ථාව වන විට මූල්‍ය අර්බුධයක සිටින ලදි. කැබිනැට් මණ්ඩලය විසින් පත්කරන ලද ටෙන්ඩර් මණ්ඩලය මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකිරීමට තීරණය කරන ලදි. NWPCP – ICB – 1 කොන්ත්‍රාත්තුව 2020 වර්ෂයේ 3 වන කාර්තුවේදී ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. | |
| (ඇ) | ප්‍රතිපාදන උපදේශන සේවා සඳහා රු. මිලියන 543 වෙන්කර තිබුණද, ඒ සඳහා රු. මිලියන 1,396 ක් වැයකර තිබුණි. එය අයවැය ප්‍රතිපාදනය සියයට 157 ක් ඉක්මවා යාමකි. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවා යාම | සටහනට යටත්ව එකඟ වෙමි.<br>3 වන විචලනය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව පූර්ව වර්ෂවල ගෙවියයුතු උපදේශන ගාස්තු ගෙවීම් නිදහස් කිරීමට පියවර ගන්නා ලදි. | පිරිවැය අවම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.3 වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) වැමැඩිල්ල ජලාශයේ වම් ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය සහ අතුඇළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාල සීමාව පුනරුත්ථාපන කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම සහ වයඹ පළාත් ඇල යටතේ ඉදිකරනු ලබන ශාඛා ඇල මාර්ග ඉදිකිරීමේ කාලසීමාව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද, පාලම් පුනරුත්ථාපන කටයුතු ස්නානය කිරීමේ ස්ථාන, ජල හැරවුම් ස්ථාන 60 ක වැඩ නිමකර නොතිබුණු අතර ස්ථාන 24 ක වැඩ ආරම්භ කරද නොතිබුණි. ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ගැටලු හේතුවෙන් වැඩ නිමකිරීම් කාලය 2020 නොවැම්බර් 4 දක්වා තවත් වර්ෂ 2 කින් දීර්ඝ කර තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යා හැකිය. | ස්ථාන 60 හි ඉතිරිව ඇති පාලම්, ස්නානය කිරීමේ ස්ථාන සහ ජලය නිකුත් කිරීමේ ස්ථාන, පුනරුත්ථාපන කටයුතු සිදුවෙමින් පවතින අතර 2020 ජූලි 15 වන විට අවසන් කිරීමට නියමිතය. ස්ථාන 24 කින් ස්ථාන 20 ක වැඩ ආරම්භ කර ඇත. වැඩ කඩිනම් කිරීමට පියවර ගනු ලැබේ. | වැඩසටහන අනපේක්ෂිත ප්‍රමාදයන් හා වියදම් අවමකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) තබ්බගහවත්ත සිට මහකිතුල ජලාශය දක්වා ප්‍රධාන ඇල සහ උමං මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දිනට සියයට 25 භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළද, ලඟාකරගත් ප්‍රගතිය සියයට 6 ක් පමණක් විය. කොරකහගොල්ල රක්ෂිතයේ කිලෝමීටර් 3 මීටර් 600 ක පමණ වූ විවිධ වර්ගයේ ගස් ඉවත්කර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින දක්වාම ඇල මාර්ගය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. තවද දේවහුව වාරිමාර්ග කඳවුර නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 10 ක් වෙන්කර තිබුණි. කෙසේවෙතත් ඉහත | කොන්ත්‍රාත් වියදම ඉහළයාම | සටහනට යටත්ව එකඟවෙමි. 2020 මැයි 31 දින වනවිට සියයට 25 ක භෞතික ප්‍රගතියක් ලගාකර ගෙන ඇත. ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත ප්‍රගතිය ලගා කරගැනීමට වැඩ කඩිනම් කරනු ලබයි. අබලන් තත්වයේ පැවතීම හේතුවෙන් දේවාහුව වාරිමාර්ග කඳවුර | |

| | | | | |
|---|---|---|---|---|
| | කඳවුර නවීකරණය කිරීම සිදු නොකර කුලී වියදම් හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 5.2 ක් වැයකර තිබුණි. | | අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් අලුත්වැඩියා කටයුතු සිදු නොකරන ලදි. | |
| (ඇ) | ඉහල ඇලහැර ඇල ICB – 01 කොන්ත්‍රාත් පැකේජයේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 65 වුවද 2019 දෙසැම්බර් 31 දිනට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 44 ක් පමණ විය. ස්ථාන 5 ක මීටර් 872 ක ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යන් වල අපේක්ෂිත ප්‍රමාදයන් වීම මත අමතර අරමුදල් අවශ්‍යතා ඇතිවිය හැකිවීම. තවද එය කෘෂිකාර්මික කටයුතු සඳහාද බලපෑමට හැකිය. | සටහනට යටත්ව එකඟ වෙමි. 2020 මැයි 31 වනවිට වර්තමාන ප්‍රගතිය සියයට 46 කි. සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන එහි ක්‍රියාකාරකම් වලින් පරිපූර්ණ විය යුතුය. |

2.4 **ඌන උපයෝජන සම්පත්**

--------------------------

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ---------------------- | --------- | ---------------- | --------------- |
| (a) | පොල්පිතිගම ව්‍යාපාති කාර්යාල ගොඩනැඟිල්ලේ ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරයාට හා නේවාසික ඉංජිනේරුවරයාට කාර්යාල පහසුකම් සපයා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික ගොඩනැඟිලි 3 ක් කුලියට ගෙන කාර්යාල පහසුකම් සැපයීමට රු.2,160,000 ක් වැය කර තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවා යාම. | සටහනට යටත්ව එකඟ වෙමි. ව්‍යාපෘති වැඩබිම් පොල්පිතිගම ව්‍යාපෘති කාර්යාලයට දුරින් පිහිටා තිබුණි. මෙහෙයුම් පිරිවැය අවම කිරීමට හා දිගු ගමන් කාලය ඉතිරිකර ගැනීම සඳහා ගොඩනැගිලි කුලියට ගෙන ඇත. පවතින වැඩබිමේ කටයුතු අවසන් වූ පසුව, එම පොල්පිතිගම කාර්යාලයට ගෙන යාමට කටයුතු කරමි. | වැඩසටහනේ ආර්ථික නොවන වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය**.** |

2.5 **පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 හා 2019 වර්ෂවලදී විදේශීය පුහුණු පාඨමාලා සඳහා රු.7,693,956 ක් සහ රු. 8,730,545 වියදම් කර තිබුණද, සංශෝධිත පුහුණු සැලැස්මේ වියදම ඇතුලත් කර නොතිබුණි. | වැඩසටහන් වියදම් ඉක්මවා යාම. | සටහනට යටත්ව එකඟවෙමි. පුහුණු අයවැය සංශෝධනය කරන ලදි. සංශෝධනය කරන ලද අයවැයේ පිටපතක් අමුණා ඇත. | වැඩසටහන පුහුණු සැලැස්ම අනුගමනය කල යුතුය. |